DECENT WORK
A better world starts here.

ILO 100 SOCIAL JUSTICE DECENT WORK

Press Release

# පුළුල් පරාසයක් තුළින් ආර්ථික සංවර්ධනය සහ ජනතා සවිබලගැන්වීම: ILO ලීඩ්+

**ILO ප්‍රවෘත්ති (කොළඹ):** ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ප්‍රධානතම ව්‍යාපෘතියක් වූ ලීඩ්+ (ආර්ථික සංවර්ධනය තුළින් ජනතා සවිබලගැන්වීම සහ ප්‍රතිසංවිධාන ව්‍යාපෘතියෙහි නවතම පියවර 2018 සැප්තැම්බර් 05 දින එළිදක්වන ලදී. මෙම නව පියවර මගින් උතුර සහ උතුරුමැද පළාත්වල යුද්ධයෙන් පීඩාවට පත් ප්‍රජාවන් නගාසිටුවීමට බලාපොරොත්තු වන අතර ඔවුන්ගේ ආර්ථික වර්ධනය සඳහා උපායමාර්ග සකසනු ලැබේ.

ඕස්ට්‍රේලියානු මහකොමසාරිස් කාර්යාලය සහ නෝර්වීජියානු තානාපති කාර්යාලයේ මූල්‍ය අනුග්‍රහයෙන් මේ ව්‍යාපෘතියේ ඉදිරි පියවර එළිදක්වනු ලැබීය. මෙම සහයෝගිතාව ව්‍යාපෘති අපේක්ෂිත ප්‍රතිපල තුළ අන්තර්ග්‍රහණය වී ඇති අතර ඉදිරි වසර 4 තුළ, උතුර සහ උතුරුමැද පළාත්වල යුද්ධයෙන් පීඩාවට පත් ප්‍රජාවන්ගේ ආර්ථික වර්ධනය සඳහා උපායමාර්ග සකසනු ලැබේ. මෙහිදී විශේෂයෙන්ම අවදානම් සහිත කාන්තාවන් සහ ආබාදිත පුද්ගලයන් වෙනුවෙන් වැඩි අවදානමක් යොමුකිරීමට බලාපොරොත්තුවේ.

මෙම ව්‍යාපෘතියේ නිල එළිදැක්වීම සඳහා ඕස්ට්‍රේලියානු මහකොමසාරිස් ගරු බ්‍රයිස් හචෙස්සන් සහ නෝර්වීජියානු තානාපති ගරු තූර්බියොන් ගවුස්තර්සේතර් යන මහත්වරුන් ආරාධිත අමුත්තන් ලෙස සහභාගි විය. උතුරු පළාත් සභාවේ කෘෂිකර්ම හා ගොවිජන සේවා, සත්ව පාලන, වාරිමාර්ග, ධීවර, ජලසම්පාදන හා පරිසර අමාත්‍ය ගරු කන්දයියා සිවනේසන් මෙන්ම, දිස්ත්‍රික්ක සහ ප්‍රාදේශීය නියෝජිතයන් මෙම අවස්ථාව සඳහා සහභාගි විය. මෙම ව්‍යාපෘතිය මුලතිව් හි උදයාර්කට්ටු ගොවි සමුපකාර සමිතියේදී එළිදැක්වුන අතර ව්‍යාපෘති සමාරම්භය එම සමුපකාර සමිතියට අනුයුක්ත එළවලු සහ පලතුරු සැකසුම් මධ්‍යස්ථානයේදී පැවැත්වුණි. මෙම එළවලු සහ පලතුරු සැකසුම් මධ්‍යස්ථානය ආර්ථික සංවර්ධනය තුළින් ජනතා සවිබලගැන්වීමේ ව්‍යාපෘතිය මගින් ඉදිකරන ලද්දකි. ආර්ථික සංවර්ධනය තුළින් ජනතා සවිබලගැන්වීමේ ව්‍යාපෘතිය උතුරු පළාත තුළ දිගු ඉතිහාසයකට හිමිකම් කියනු ලැබේ. වර්ෂ 2011 දී ආරම්භ කරනලද මෙම ව්‍යාපෘතිය සඳහා ඕස්ට්‍රේලියානු සහ නෝර්වීජියානු මූල්‍ය අනුග්‍රහය නොබඳව ලබාදෙන ලදී. මෙම ව්‍යාපෘතිය ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ජනතා සවිබලගැන්වීමේ උපායමාර්ග අධ්‍යයනය කරමින් රැකියා උත්පාදනයට හා අදායම් උත්පාදනයට දැවැන්ත ඇඟවුමක් ලෙස කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ විශේෂයෙන්ම ධීවර, පළතුරු සහ එළවළු අංශවල භාවිතවිය.

අගයදාම විශ්ලේෂණය ප්‍රවර්ධනය ආර්ථික සංවර්ධනය තුළින් ජනතා සවිබලගැන්වීමේ ව්‍යාපෘතියේ මූලික අංගයක් වුවත්, අවදානම් සහිත කාන්තාවන් සහ ආබාදිත පුද්ගලයන් වෙනුවෙන් වැඩි අවදානමක් යොමුකිරීම මෙන්ම, ප්‍රතිපත්ති සම්පදනය ක්‍රියාදාමයට පහසුකම් සැපයීම මගින් පශ්චාත් අර්බුද සමථකරණයට ප්‍රධාන කාර්යභාරයක් ඉටු කළේය.

පෙර අවදිවල මෙන්, මෙම ව්‍යාපෘතිය පෞද්ගලික සහ පොදු ක්ෂේත්‍රවල සහයෝගීතාව සහ හවුල්කාරිත්වය පෙරදැරිව සමුපකාර, රාජ්‍ය සහ පෞද්ගලික අංශ හවුල්කරුවන්, ජාතික අපනයනකරුවන්ගේ මණ්ඩලය, ජාතික හා පළාත් වාණිජ මණ්ඩලය, ජාතික මුහුදු ආහාර අපනයනකරුවන්ගේ සංගමය, සේව්‍ය සමිති සම්මේලනය, වෘත්තීය සමිති සහ රජයේ ජාතික සහ පළාත් මට්ටම් වල එක්ව ක්‍රියාකරනු ලැබේ.

ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ දේශීය අධ්‍යක්ෂිකා සිම්රින් සිං මහත්මිය විසින් ආර්ථික සංවර්ධනය තුළින් ජනතා සවිබලගැන්වීමේ ව්‍යාපෘතිය ඉටු කළ යුතු කාර්යය පිළිබඳව සිය උද්යෝගය ප්‍රකාශ කරමින් කියා සිටියේ " ව්‍යාපෘතියේ ප්‍රවිෂ්ටය ප්‍රයෝගිකව, ගැටුම් සංවේදී වන අතර අවසානයේ දී දේශීය ගොවිතැන, ධීවර ප්‍රජාව, නිෂ්පාදකයාගේ සංවිධාන සහ කුඩා හා මධ්‍යම ව්‍යවසායකයන් සවිබල ගැන්වීම මගින් ශ්‍රී ලංකාව පශ්චාත් ගැටුම් සංවර්ධනයෙන් ප්‍රයෝජන ලබා ගැනීමට හැකිවී ඇත. තිරසාරභාවය වර්ධනය කිරීම, ව්‍යාපෘතියේ පුළුල් පරාසය තුළ තිරසාරත්වය සහතික කිරීම මෙමගින් හැකිවී ඇත".

ILO Office for Sri Lanka and the Maldives
202 – 204, Bauddhaloka Mawatha,
Colombo 7,
Sri Lanka.

Tel. +94 11 259 2525
Fax. +94 11 250 0865
E-mail: colombo@ilo.org
www.ilo.org/colombo

For information only. Not an official record.

DECENT WORK
A better world starts here.

SOCIAL JUSTICE
DECENT WORK

Press Release

ඕස්ට්‍රේලියානු මහකොමසාරිස් ගරු බ්‍රයිස් හචෙස්සන් මහතා අදහස් දක්වමින් පවසා සිටියේ ඔස්ට්‍රේරේලියාව ආර්ථික සංවර්ධනය තුලින් ජනතා සවිබලගැන්වීමේ ව්‍යාපෘතිය සිය සාර්ථක හවුල්කාරීත්වය අඛණ්ඩව පවත්වා ගෙන ඒම පිලිබඳ තෘති වන බවයි. මීට අමතරව උතුරු පළාතේ පිරිමින් හා කාන්තාවන් සඳහා තිරසාර ජීවනෝපාය මාර්ග ඇති කිරීම සඳහා 2011 වර්ෂයේ සිට ආර්ථික සංවර්ධනය තුලින් ජනතා සවිබලගැන්වීමේ ව්‍යාපෘතිය මගින් ලබා ගන්නා ලද කැපී පෙනෙන ප්‍රතිපල සම්බන්ධයෙන් ජාත්‍යන්තර කම්කරු සංවිධානය වෙත ප්‍රශංශා කරනු ලැබීය. දූරදර්ශි සමාජ හා ආර්ථික වෙනස්කම් ලගාකරගනීමට අවශ්‍ය වන්නේ නව්‍යකරණය, අවධානය සහ අඛණ්ඩ පැවැත්මයි. එය ලබා ගැනීමට අසීරු විය හැකි අතර මන්දගාමී වේ. එහෙත් ආර්ථික සංවර්ධනය තුලින් ජනතා සවිබලගැන්වීමේ ව්‍යාපෘතිය විසින් ලබාගත හැක්කේ කුමක්දැයි පෙන්නුම් කර දී  තිබේ.

නෝර්වීජියානු තානාපති ගරු තූර්බියොන් ගවුස්තර්සේතර් මහතා අදහස් දක්වමින් පවසා සිටියේ මෙම ව්‍යාපෘතිය සඳහා ජාත්‍යන්තර කම්කරු සංවිධානය මගින් නෝර්වේජියානු ආධාර  කාර්යක්ෂම ලෙස යොදා ගනු දැකීම සතුටට කරුණක් බවත්ය. තවද වෙළඳපල ව්‍යප්තිය සහ තිරසාරත්වය සඳහා ප්‍රධාන වශයෙන් පෞද්ගලික අංශය සමග සම්බන්ධ වීම අත්‍යවශ්‍ය බව තමා විශ්වාස කරන බවත් ඒ මහතා සඳහන් කර සිටියේය. පළතුරු සහ මත්ස්‍ය සැකසුම් කර්මාන්තශාලා පිහිටුවීම මගින් ප්‍රාථමික නිෂ්පාදනවල වටිනාකම ඉහළ නැංවීමෙන් වැඩි රැකියා අවස්ථා ඇති කර එම ප්‍රදේශ තුළ සම්පත් රඳවා ගැනීමට හැකි වනු ඇති බව  ගවුස්තර්සේතර් මහතා වැඩිදුරටත් කියා සිටියේය.

ලීඩ්+ ව්‍යාපෘතිය ජාත්‍යන්තර කම්කරු සංවිධානය හි ගෝලීය ප්‍රධානතම වැඩසටහනේ කොටසකි. විශේෂයෙන් ගැටුම්වලින් බලපෑමට ලක් වූ සහ ආපදා සහිත රටවලට යෞවන යෞවනනියන් සාමය හා විපර්යාස වලට ඔරොත්තුදීමේ හැකියාව සඳහා වන රැකියා හා  රැකියා උත්පාදනය කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ඇත. මෙම ව්‍යාපෘතිය දිගුකාලීන තිරසාර සමාජ ආර්ථික සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා රජයේ දැක්ම සමග ඉතා සමීපව කටයුතු කර ඇත.

ලීඩ්+ ජාත්‍යන්තර  කම්කරු සංවිධානයේ  සුනිසි මෙහෙවර අරමුණු ශාක්ෂාත් කරගැනීමටත්, එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන රාමුව (UNSDF) අපේක්ෂතා ප්‍රතිපල ලගාකරගනීම සඳහාත් පෙලගැසී ඇත.

එහි මූලික හරයක් වන ලීඩ්+  ඉතා වැදගත් වන ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ප්‍රයත්නයකි, සුනිසි රැකියා නිර්මාණය කිරීමෙහි ලා එහි අරමුණ වන්නේ, ගැටුම් පීඩාවට පත් ප්‍රජාවන් සවිබලගැන්වීමයි. වසර 2019 දී ජාත්‍යන්තර  කම්කරු සංවිධානය සිය සියවස සැමරීම නිමිත්තෙන්, ලීඩ්+  දියත් කිරීම නිසා ශ්‍රී ලංකාව වෙත ජාත්‍යන්තර  කම්කරු සංවිධාන හි දායකත්වය කැපී පෙනෙන සන්ධිස්ථානයකි.

ILO Office for Sri Lanka and the Maldives
202 – 204, Bauddhaloka Mawatha,
Colombo 7,
Sri Lanka.

Tel.  +94 11 259 2525
Fax. +94 11 250 0865
E-mail: colombo@ilo.org
www.ilo.org/colombo

For information only.  Not an official record.

Press Release

ILO Office for Sri Lanka and the Maldives
202 – 204, Bauddhaloka Mawatha,
Colombo 7,
Sri Lanka.

Tel. +94 11 259 2525
Fax. +94 11 250 0865
E-mail: colombo@ilo.org
www.ilo.org/colombo

*For information only. Not an official record.*